03/11/2011

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 30 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2009 මැයි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2009 මැයි මස 22 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2009 අංක 30 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මැයි මස 18 වන දින]

එල්.ඩී.—ඕ. 45/2008.

**2007 අංක 55 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 30 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. 2007 අංක 55 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 2007 අංක 55 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියෙහි අතුරු විධානය ඉවත් කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

> " (2) ප්‍රධාන ප්‍රඥප්තිය ප්‍රකාරව වූ නාම යෝජනා පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන දිනයක දී පළ කරනු ලැබිය යුතු ය. එම දිනය මෙම සංශෝධනය ක්‍රියාත්මක වීමේ දිනයේ සිට මාස දහයකට පසු නොවන දිනයක් විය යුතු ය. ".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—PL 003773—3,490 (2009/03)

CamScanner